# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2003/41 - 2017 ජනවාරි මස 27 වැනි සිකුරාදා - 2017.01.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමා විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා. කා. අංකය : සීඑස්ජ්/1/සීඕඅයි/එම්එස්/02.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති**

**මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

1. ගරු කංකානි තන්ත්‍රි චිත්‍රසිරි මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
2. ගරු ප්‍රසන්න සුජීව ජයවර්ධන මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
3. කන්දසාමි වේලුපිල්ලේ මැතිතුමා
   විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපති

වෙත,

ශුභාශිංසන පූර්වකවයි !

මෙහි උපලේඛනයෙහි සඳහන් කාරණයට අදාළව සිදු කෙරුණු අක්‍රමිකතා මගේ අවධානයට යොමු කරනු ලැබ ඇති හෙයින් ද ;

තවද මේ අධිකාර පත්‍රය යටතේ ඉහත කී කාරණය පිළිබඳ විමර්ශන හා පරීක්ෂණයන්හි විෂයය ප්‍රමාණය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව (මෙහි මින්මතු CBSL යනුවෙන් සඳහන් කරනු ලබන) ඇතුලු අදාළ බලධාරීන් විසින් සිය ව්‍යවස්ථාපිත හා නෛතික වගකීම් ක්‍රියාත්මක කිරීම කෙරෙහි කිසිදු ආකාරයකින් බාධකයක් පනවාලීමක් සිදු නොවන බවත් සැලකිල්ලට ගනිමින් හා එකී ලිඛිත නීති ප්‍රකාරව කටයුතු කිරීම සලකා බැලීම සහ හැකි අවස්ථාවන්හි ගත හැකි ක්‍රියාමාර්ග තවදුරටත් ඉටුකරලීමට, මෙම අධිකාරි පත්‍රය ප්‍රකාරව පවත්වනු ලබන පරීක්ෂණ හා විමර්ෂණ නොතකා, එකී අදාළ බලධාරීන් අදාළ ලිඛිත නීතීන් ප්‍රකාරව බලගන්වන බව සැලකිල්ලට ගනිමින් ද ;

මෙම අධිකාර පත්‍රය යටතේ මෙම විමර්ශනය හා පරීක්ෂණය පවත්වනුයේ ඉහත කී ආකාරයෙන් සිය ව්‍යවස්ථාපිත හා නෛතික වගකීම් ඉටු කරලීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුලු අදාළ බලධාරීන් විසින් ගනු ලැබ ඇති හෝ ගනු ලබන කිසියම් ක්‍රියාමාර්ගයන්ට අමතරව හා ඒවාට අගතියක් සිදු නොවන පරිදි බැව් සැලකිල්ලට ගනිමින් ද ;

තවද, මෙහි උපලේඛනයෙහි සඳහන් කෙරුණු එකී කාරණය පිළිබඳව පරීක්ෂණයන් හා විමර්ශනයන් සිදු කිරීමට අවශ්‍යවී ඇති අතර, එකී අක්‍රමිකතා සත්‍ය බවට හෙළිවුවහොත් මෙහි උපලේඛනයෙහි සඳහන් කෙරුණු කාරණයට අදාළව සිදු කෙරෙන අක්‍රමිකතාවන්ට එලෙසින් සම්බන්ධ වී ඇතැයි කියනු ලබන තැනැත්තන් හඳුනාගැනීමක් අවශ්‍ය වී ඇති හෙයින් ද ;


1A - G 25022 — 22 (2017/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තවද, මෙහි ඉහත කී උපලේඛනයේ සඳහන් කෙරුණු එකී කාරණයට අදාළව සිදු කෙරුණු එකී අක්‍රමිකතා පිළිබඳව වගකිව යුතු තැනැත්තා හෝ තැනැත්තන් හඳුනාගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් ද ;

තවද, ඉදිරි කාලයේදී එබඳු ක්‍රියාවන් යළි සිදුනොවන බවට සහතික කරගනු පිණිස කවර ක්‍රියාමාර්ග ගත යුතුද යන්න නිශ්චය කරගනු පිණිස ඉහත කී මෙහි උපලේඛනයේ සඳහන් කෙරුණු කාරණය පිළිබඳ එකී විමර්ශනය හා පරීක්ෂණය පැවැත්වීම ජාතික යහපත උදෙසා වන්නක් බව මාගේ මතය වන හෙයින් ද ;

ඉහත කී මෙහි උපලේඛනයේ සඳහන් කෙරුණු මෙකී කාරණය පිළිබඳ විමර්ශනය හා පරීක්ෂණය සිදුකර වාර්තා කරනු පිණිස පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම අවශ්‍ය බව මගේ අදහස වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමර්ථ්‍යය, ස්වාධීනත්වය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, සංශෝධිත පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරය) 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඉහත කී,

1. ගරු කංකානි තන්ත්‍රි චිත්‍රසිරි මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
2. ගරු ප්‍රසන්න සුජීව ජයවර්ධන මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
3. කන්දසාමි වේලුපිල්ලේ මැතිතුමා
   විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපති

වන ඔබතුමන්ලා මතු දැක්වෙන දෑ පිළිබඳව විමර්ශනය කර, පරීක්ෂාකොට වාර්තා කරනු පිණිස මගේ කොමසාරිස්වරුන් ලෙසින් මෙයින් පත්කරමි ;

(අ) මෙහි උපලේඛනයේ සඳහන් කෙරුණු කාරණයට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමනාකරණය, පරිපාලනය සහ කටයුතු පවත්වාගෙන යාම ;

(ආ) රජයට හෝ ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුලු කිසියම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හානියක් හෝ හානිකර ප්‍රතිඵලයක් ගෙන දෙමින් මෙහි උපලේඛනයෙහි සඳහන් ඉහත කී කාරණයට අදාළව එම කළමනාකරණය, පරිපාලනය හා කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් යම් අවපරිචයක්, අක්‍රමිකතාවක් හෝ අදාළ නිසි කාර්යපටිපාටීන්ට අනුකූලව ක්‍රියා නොකිරීමක් හෝ නොසලකා හැරීමක් සිදුවී තිබේද යන වග ;

(ඇ) රජයට හෝ ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුලු කිසියම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හානියක් හෝ හානිකර ප්‍රතිඵලයක් ගෙන දෙමින් ඉහත කී උපලේඛනයේ සඳහන් මෙකී කාරණයට අදාළව යම් ගිවිසුම්කාරී බැඳීමකට, වංචනිකව, අපරීක්ෂාකාරීව, නොසැලකිලිමත් ලෙස හා වගකීමෙන් තොරව මෙහි උපලේඛනයෙහි සඳහන් ඉහත කී කාරණයට අදාළව යම් ගිවිසුම්කාරී බැඳීමකට ඇතුළත්විණිද යන වග ;

(ඈ) රජය වෙනුවෙන් මෙහි උපලේඛනයෙහි සඳහන් කෙරුණු ඉහත කී කාරණයට අදාළව ටෙන්ඩර් කැඳවීමේ හෝ ගිවිසුම් හෝ කොන්ත්‍රාත්තුවලට එළඹීමේදී අදාළ වන නිසි කාර්ය පටිපාටියට අනුකූලව ක්‍රියාකිරීමක් හෝ එම කාර්ය පටිපාටිය නොසලකා හැරීමක් සිදු වී තිබේද යන වග ;

(ඉ) මෙහි උපලේඛනයෙහි සඳහන් එකී කාරණයට අදාළව නිසි කාර්ය පටිපාටීන්ට අනුකූලව එලෙසින් ක්‍රියා නොකිරීම හෝ නොසලකා හැරීමේ හේතුවෙන් ඉහත කී උපලේඛනයෙහි සඳහන් බැඳුම්කර අලෙවිය සම්බන්ධයෙන් අනිසි හෝ අක්‍රමික ලෙස හෝ වෙනස් ලෙස සැලකීම මගින් බැඳුම්කර අලෙවිය සඳහා කිසියම් ටෙන්ඩරයන් ප්‍රදානය කිරීමක් සිදු වී තිබේද යන වග ;

(ඊ) ඉහත කී උපලේඛනයේ සඳහන් ඉහත කී කාරණය හේතුකොට ගෙන රජයට ප්‍රශස්ථ මිලක් (optimum price) හෝ ප්‍රතිලාභයක් ලැබීම සහතික කරගනු පිණිස නිසි කාර්යය පටිපාටීන් හා ආරක්ෂිත පියවර ගනු ලැබ තිබේද යන වග ;

(උ) ඉහත කී උපලේඛනයේ සඳහන් එකී කාරණය සම්බන්ධයෙන් රජයට හෝ ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුලු රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයකට, හානියක් හෝ හානිකර වූ ප්‍රතිඵලයක් සිදු කිරීමට තුඩුදුන් ක්‍රියාව හෝ අත්හැරීමක් හෝ ක්‍රියාකලාපයක් සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තා හෝ තැනැත්තන් ;

(ඌ) ඉහත කී උපලේඛනයේ සඳහන් කාරණය පිළිබඳව යම් පරීක්ෂණයක් හෝ විමසා බැලීමක් පැවැත්වීමට යම් ආකාරයකින් අවහිර කිරීමක් හෝ වලක්වාලීමක් සිදුවීම හේතුවෙන් රජයට හෝ ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුලු කිසියම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හානියක් හෝ හානිකර ප්‍රතිඵලයක් සිදු වී තිබේද යන වග සහ, එසේ සිදුවූයේ නම් එබඳු අවහිර සිදුකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තා හෝ තැනැත්තන් ;

(එ) රජයට ප්‍රශස්ථ මිලක් (optimum price) හෝ ප්‍රතිලාභ අත්කරගනු පිණිස මෙහි උපලේඛනයේ සඳහන් කාරණය සම්බන්ධව කටයුතු විනිවිදභාවයෙන් හා නිසි වගවීමෙන් යුතුව ඉටු කරනු ලැබීම සහතික කරගනු පිණිස ඉදිරියේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටීන් ;

(ඒ) ඉහත කී උපලේඛනයේ සඳහන් කාරණයට අදාළව අවභාවිතය හෝ බලය අනිසි ලෙස යෙදවීම, බලපෑම, මැදිහත්වීම, වංචාව, අවපරිචය, ඥාති සංග්‍රහය හෝ දූෂිත ක්‍රියාවන් හා සම්බන්ධවූ ඕනෑම ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සිදු වී තිබේ ද යන වග ;

සහ මෙම අධිකාර පත්‍රයෙහි නියමයන් යටතේ පරීක්ෂණයට හෝ විමර්ශනයට භාජනය කරනු ලැබ ඇති මෙහි උපලේඛනයේ සඳහන් කෙරුණු කාරණයට අදාළව නිර්දේශ ඉදිරිපත් කිරීම.

තවද, පූර්වෝක්ත කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් ඉහත කී ගරු කංකානි තන්ත්‍රි චිත්‍රසිරි මැතිතුමා වන ඔබ මම මෙයින් පත් කරමි.

තවද, ඉහත කී උපලේඛනයෙහි සඳහන් කෙරුණු කාරණය සම්බන්ධයෙන් අවශ්‍ය යැයි ඔබහට පෙනී යා හැකි සියලුම පරීක්ෂණ පැවැත්වීමටත් සෙසු සියලුම විමර්ශනයන් කිරීමටත් ඉහත කී කොමසාරිස්වරුන් වන ඔබතුමන්ලාට මා මෙයින් බලය හා අධිකාරිය පවරන අතර මේ අධිකාරි පත්‍රයෙහි දින සිට මාස තුනක් ඇතුළත ඔබගේ පරීක්ෂණයන්හි සහ විමර්ශනයන්හි නිගමනයන් හා ඒවාට අදාළ ඔබගේ නිර්දේශයන් ගෙනහැර දක්වමින් වාර්තාවක් ඔබගේ අත්සනින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස ඔබතුමන්ලාට මෙයින් නියම කරමි.

තවද, ඉහත කී උපලේඛනයෙහි සඳහන් කෙරුණු පූර්වෝක්ත කාරණයට අදාළ කිසියම් විමර්ශනයක හෝ පරීක්ෂණයක යම් කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු බවට ඔබේ අභිමතය පරිදි නිශ්චය කරනු ලැබේ නම්, එම කොටස ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතුයැයි මම ඔබට මෙයින් නියම කරමි.

තවද, ඔබගේ විමර්ශනයන්හි හෝ පරීක්ෂණයන්හි කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිනු ලැබිය හැකි සියලුම රජයේ නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් තත්කාර්යය සඳහා නිසි පරිදි දෙනු ලැබිය හැකි සියලුම සහාය දිය යුතුයැයි ද, සපයනු ලැබිය හැකි සියලුම තොරතුරු සැපයිය යුතුයැයි ද මෙයින් නියම කොට විධාන කරමි.

තවද, ඉහත කී පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියෙහි විධිවිධාන මෙම කොමිෂන් සභාවට අදාළ විය යුතු බව මම මෙයින් ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහහතක් වූ ජනවාරි මස 27 වන දින වන මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

උපලේඛනය

2015 පෙබරවාරි මස 01 වැනි දින සිට 2016 මාර්තු මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ භාණ්ඩාගාර බැඳුම්කර (මෙහි මින්පසු එම භාණ්ඩාගාර බැඳුම්කර යනුවෙන් හඳුන්වනු ලබන) නිකුතුව ;

(අ) මතු දක්වන කරුණුවලට අදාළ තීරණයන් ඇතුලුව එම භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවට පූර්වයෙන් වූ තීරණ ගැනීමේ ක්‍රියාවලියන්ද -

(i) එම එක් එක් භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව මගින් සපයා ගැනීමට අපේක්ෂා කළ මුදල් ප්‍රමාණය ;

(ii) එම එක් එක් භාණ්ඩාගාර බැඳුම්කර මත ගෙවිය යුතු පොලී අනුපාතය හෝ ගෙවිය යුතු පොලී අනුපාතය නිගමනය කිරීමේ ක්‍රමවේදය.

(iii) එම එක් එක් භාණ්ඩාගාර බැඳුම්කර මත පොලිය ගෙවිය යුතු දිනයන්.

(iv) එම එක් එක් භාණ්ඩාගාර බැඳුම්කර මුදල් ගෙවා බේරුම් කරගනු පිණිස එකී භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවට අදාළ නිදන් අරමුදල් දායක මුදලක් වශයෙන් ඒකාබද්ධ අරමුදලෙන් සහ ශ්‍රී ලංකාවේ වත්කම්වලින් මුදල් ලබා ගත හැකි අනුපාතිකය සහ එසේ මුදල් ලබාගත හැක්කේ කවර කාලසීමාවක් අවසානයේදී ද යන වග සහ එකී දායක මුදල ආරම්භ විය යුත්තේ කවර දිනයක සිට ද යන වග

(v) එම එක් එක් භාණ්ඩාගාර බැඳුම්කර නිදහස් කිරීමේ දිනය (Date of redemption)

(ආ) ප්‍රාථමික ගැනුම්කරුවන්/වෙළෙඳුන් (Primary Dealers), ඍජුව සහභාගි වන්නන් (Direct participants) හෝ ඍජු වශයෙන් සහභාගි වන වෙළෙඳුන් (Dealer Direct Participants) විසින් එම භාණ්ඩාගාර බැඳුම්කර අලෙවි කිරීම.

02 - 558

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.